# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,944 — 1964 පෙබරවාරි 7 වැනි සිකුරාද — 1964.2.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 155 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 162 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 164 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 173 | විවිධ දැන්වීම ... ... ... | — |


[සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වෙනි කොටසේ "කුලී මෝටර් රථ සේවාවන්" පැවැත්වීම සඳහා මගීන් ගෙනයෑමේ අවසරපත් ඉල්ලීමේ අයැදුම්පත් ලැයිස් තුවක් පළවේ.]

## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස. යථා යෝග්‍ය පරිදි විශාම වැටුප් සහිත/විශාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂාකාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත් වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂාකාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළහැකි වන්නේ ය.

**සංලක්‍ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙන් ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණ යකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කින් සමත්වීමටද ඔවුන්ට නියම වනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) නාමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත්

ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූද, රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාල නොවන්නේ ය).

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රැජිනියන් වහන්සේගේ යුද හමුදාවන් හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මිහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන් හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කලෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලක රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටින් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන් දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතු වෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු, ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

අංක ඒ. 68/ඇක්ස්. 1455/63.

## තක්සේරු දෙපාර්තමේන්තුව

### සහකාර තක්සේරුකරු තනතුරු

ඉහත සඳහන් තනතුරට අයදුම් පත් කැඳවමින් 1963.11.29 දින, අංක 13,837 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවුනු 1963.11.25 දින දරණ දැන්වීම පිළිබඳවයි. 1963 දෙසැම්බර් 13 වැනි දිනට, වයස අවුරුදු 21 ට නොඅඩුවූද, වයස අවුරුදු 35 ට නොවැඩිවූද අධිකාරී පත්‍රලත් වෙන්දේසිකරුවන්ගේ හා වතු නියෝජිතයින්ගේ ආයතනයෙහි (පළාත් අංශයෙහි) අවසාන පරීක්ෂණයෙන් සමත් වී ඇති අයදුම්කරුවන්ගෙන්ද සහකාර තක්සේරුකරු ශ්‍රේණියට කෙළින්ම බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගන්නා බව සාමාන්‍ය දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. එවැනි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය මෙසේ ය:—

(අ) දේශීය අයදුම් පත් 64.2.21.

(ආ) විදේශීය අයදුම් පත් 64.2.28.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,<br>
තැ. පෙ. අංක 500,<br>
ගාලුමුවදොර මහලේකම් කාර්යාලයය,<br>
කොළඹ.<br>
1964. 2. 1.

2–205—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

අංකය : ශිෂ්‍ය/399.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කියවන දෑ නිෂ්පාදනය පිළිබඳ යුනෙස්කෝ අධි ශිෂ්‍යත්ව, 1963/64

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික ආයුතනයේ 1963/64 කාර්මික ආධාර වැඩ සටහන යටතේ කියවන දෑ නිෂ්පාදනය පිළිබඳ අධි ශිෂ්‍යත්වයක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. අධි ශිෂ්‍යත්වයේ අදහස වනුයේ, පොත් නිෂ්පාදනය දියුණු කිරීම, නිෂ්පාදන තත්ත්වය උසස් කිරීමේ හා බෙදාහැරීමේ ක්‍රම දියුණු කිරීම, පොතපත කෙරෙහි ජනතාව තුළ යථා හැඟීමක් ඇතිකුරවීම හා පොතපත ලබාගැනීම පහසු කිරීම ආදියට උපකාරී වීම ය. අධ්‍යයන විෂයයන් මෙසේ ය:—

(අ) **ග්‍රන්ථ චිත්‍ර කරණය:** චිත්‍රය, කැටයම් කිරීම, නිරේඛනය, ලිතෝ මුද්‍රණය හා ලී කැටයම් කෙරෙහි විශෙෂ අවධාරණයක් ඇතිව. ග්‍රන්ථ චිත්‍රකරණය පිළිබඳ සමකාලීන සංකල්පයන් හා ක්‍රමයන් හැදෑරීම;

(ආ) කඩදාසි බැම්ම සහිත පොත් පිළියෙල කිරීම, නිෂ්පාදනය, බෙදාහැරීම හා ඒවායේ තත්ත්වය උසස් කිරීම පිළිබඳව හැදෑරීම.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ, කියවන දෑ නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳ ජාතික ව්‍යාපාරයන් පුළුල් කිරීමට ආධාර දීමෙන්, මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

සංලක්ෂ්‍යය 1: රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණ ය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතු ය;

සංලක්ෂ්‍යය 2: මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 23 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය;

සංලක්ෂ්‍යය 3: එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණ ය.

2. ශිෂ්‍යත්ව කාලය.—ශිෂ්‍යත්ව කාලය යුනෙස්කෝ අධිකාරීන් විසින් තීරණය කරන පරිදි වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නො පැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ යුනෙස්කෝ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. සුදුසුකම්.—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි:—

(අ) ලංකාවේ පුරවැසියන් විය යුතු යි;

(ආ) 1964.4.1 වැනි දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු යි;

(ඉ) රජයේ සේවකයෙක් නම්, 6 වැනි ප්‍රමාණයේ මට්ටමට සිංහල දැනීමක් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ හැකි විය යුතු යි.

(ඊ) මේ නිවේදනයෙහි 1 වැනි ඡේදයේ (අ) සහ (ආ) යටතේ සඳහන් විෂයයන්ට එක එල්ලේ සම්බන්ධතාවකින් කටයුතු කරන අය විය යුතු යි;

(උ) විදේශයක පාඨමාලාවක් අනුගමනය කිරීමට ප්‍රමාණවත් උසස් ඉංග්‍රීසි දැනුමක් තිබිය යුතු යි.

5. යට දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය :—

(1) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය.

(2) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, හැකියාව සහ මෙම තනතුරට යෝග්‍ය බව සඳහන් මෑතකදී ලබාගත් සහතික පත් දෙකක්. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන්ගෙන් මෙම උප ශීර්ෂය යටතේ නියමිත ලියවිලි අනවශ්‍යය.)

**සැළකිය යුතුයි.**—මෙකී සහතික පිටපත් අයදුම් කරුවන් වෙත පෙරලා එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ අයදුම් කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්, එවන ඉල්ලුම් පත්, නියමිත දිනය ඉක්මවා ලැබුණහොත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එය ලැබී ඇත්තේ නියමිත කාලසීමාව තුළ නම් හා ප්‍රමාදයට ඒත්තු වන හේතු දක්වන්නේ නම් මිස එය පිළිගනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙතට හැර මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් හා අදාල පොදු කොන්දේසි බලන්න.

9. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

එස්. බී. සේනානායක,
වැඩ බලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

1964 ජනවාරි මස 30 දින,
කොළඹ 7.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**සහකාර ශබ්ද ගන්වන්නාගේ තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :————.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) 1964 පෙබරවාරි මස 22 වැනි දිනට නියම වයස :————.
   අවුරුදු :————, මාස :————, දින :————.
   (ආ) උපන් දිනය :————.

4. ජාතිය :—
   (1) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පෙළපතින් ද යන වග :————.
   (2) ලාංකිකත්වය පෙළපතින් නම් යට දැක්වෙන අය උපන් තැන දන්වන්න :—
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් ඉහත 5 (1) වැනි ඡේදය ප්‍රකාර සහතික පිටපත් අමුණන්න.

6. ශබ්ද ගැන්වීමේ පළපුරුද්ද හා ශබ්ද ගැන්වීමේ උපකරණ, පටිගත කිරීමේ යන්ත්‍ර යනාදිය නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර.

7. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

8. සේවා මුක්ත හටයින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේ ද යන වග (එසේ නම් සේවයෙන් අස්වී යෑමේ සහතිකය හෝ වෙනයම් සාක්ෂි හෝ අමුනා එවිය යුතුය.) :————.

9. රජය යටතේ කිසිවිටෙක සේවය කර ඇත්නම් ඒ කවදා කොතැනද යන්න (එක් එක් දෙපාර්තමේන්තුවේ කළ සේවා කාලය දැන්විය යුතුය) :

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–152—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

### I වැනි ශ්‍රේණියේ සහකාර ශබ්ද කාර්මික තනතුරු

ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ I වැනි ශ්‍රේණියේ සහකාර ශබ්ද කාර්මික තනතුරක් සඳහා මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීම කෙළවර ඇති ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත් 1964.2.22 වැනි දිනට පළමු ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් "කොළඹ 7, ලංකා ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්" නමට එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නො ලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "ශබ්ද කාර්මික" යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,820—120 හා 180—රු. 5,340.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මුල් වතාවේ පත්වීම දෙනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාලයකටය.

4. **අවශ්‍ය සුදුසුකම්:**—(i) සෑම අයදුම්කරුවෙක්ම යට දැක්වෙන අවශ්‍යතා සතු බව ඔප්පුවෙන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) 1964.2.22 වැනි දිනට වයසින් අවුරුදු 30ට නොඅඩු හා 40ට නොවැඩි බව. දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූ අයට මෙම වයස් සීමාව අදාල නොවේ.

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ උසස් විභාගයකින් හෝ සාමාර්ථය ලබා ශබ්ද කැවීම පිළිබඳ පළපුරුද්දක් ඇතිව, ශබ්ද කැවීමේ යන්ත්‍ර, පටිගත කිරීමේ යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර, චිත්‍රපට ප්‍රොජෙක්ටර් යන්ත්‍ර යනාදිය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම පිළිබඳ දස අවුරුදු ප්‍රායෝගික පළපුරුද්දක් ඇතිව සිටිය යුතුයි.

පසළොස් අවුරුදු ප්‍රායෝගික පළපුරුද්දක් ඇති, කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලැබූ අයගේ අයදුම් පත්‍ර ගැනද සලකා බලනු ලැබේ.

**සංලක්ෂණය :** (i) ශබ්ද කැවීමේ යන්ත්‍ර, පටිගත කිරීමේ යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර, චිත්‍රපට ප්‍රොජෙක්ටර් යන්ත්‍ර යනාදිය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම පිළිබඳ 15 අවුරුදු ප්‍රායෝගික පළපුරුද්දක් ඇති රජයේ චිත්‍රපට ආයතනයේ නිලධාරීන්වද, අධ්‍යාපනික සුදුසුකම් නොතකා මෙම තනතුරට ඉල්ලුම් කළ හැක.

(ii) අපේක්ෂකයා සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයකු වන විටදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් හෝ සිංහල භාෂා විෂයයෙන් නැතහොත් ඊට සමාන වෙනත් විෂයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි.

(1961 ජනවාරි 1 වැනි දිනට පෙර දිනක රජයේ සේවයේ නියුක්තව සිටි, නිලධාරීන්ට මෙම අවශ්‍යතාව අදල නොවනු ඇත).

(ඇ) මනා චරිතයකින්ද, කායික සෞඛ්‍යයෙන්ද යුක්ත විය යුතුයි.

5. ඉල්ලුම්කරුවන් විසින් යට සඳහන් ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

(i) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය, සහ

(ii) අයදුම්කරුගේ චරිතය, සුදුසුකම්, කාර්‍ය්‍ය ශූරත්වය සහ තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යත්වය දැක්වෙන මෑතකදී ලබාගත් සහතික දෙකක් (රජයේ සේවයේ දැනටම යෙදී සිටින අයදුම් කරුවන්ගෙන් මෙම උපඡේදය යටතේ සහතික අනවශ්‍යය).

**සැළකිය යුතුයි.**—මෙම ලියකියවිලි පිටපත් ඉල්ලුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් ලියකියවිලි එවිය යුත්තේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

6. නියමිත දින ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත කාලසීමාව තුළදී ලැබී ඇත්නම් හා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එය පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස භාරගනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධයෙන් සෙසු ලියකියවිලි එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙතට මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වන ඡේදයේ මුල පළවන රාජ්‍ය සේවා පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසි බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

එස්. බී. සේනානායක,
වැඩ බලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජෙනරාල්.

1964 ජනවාරි 30 දින,
කොළඹ 7.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

### I වැනි ශ්‍රේණියේ සහකාර ශබ්ද කාර්මික තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.
2. ස්ථිර ලිපිනය :————.
3. (අ) 1964 පෙබරවාරි 22 වැනි දිනට නියම වයස :—
   අවුරුදු :——, මාස :——, දින :——.
   (ආ) උපන් දිනය :————.
4. ජාතිය :————.
   (i) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පරම්පරාවෙන් ද යන වග :————.
   (ii) ලාංකිකත්වය පාරම්පරිකව නම් යට සඳහන් අය උපන් ස්ථානය සඳහන් කරන්න.
      (අ) අයදුම්කරු :————.
      (ආ) අයදුම්කරුගේ පියා :————.
      (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
      (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (5 (1) ඡේදය යටතේ සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)
6. පළපුරුද්ද :————.
7. අමුනා එවා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපින :————.
8. සේවා මුක්ත භටයන් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේ ද යන වග :————.
9. රජයේ සේවයේ කිසි කලෙක යෙදී සිටියේ නම් ඒ කවදාද, කොතැනකද, යනවග (ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කළ කාලය වෙන් වශයෙන් දක්විය යුතුය) :————

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2–153—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ජාතික කලායතන දෙපාර්තමේන්තුව

### ගායනය පිළිබඳ කථිකාචාර්ය තනතුර

ශ්‍රී ලංකා ජාතික කලායතනය දෙපාර්තමේන්තුවේ ගායනය පිළිබඳ කථිකාචාර්ය තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙළ වූ ඉල්ලුම් පත් 1964 පෙබරවාරි මස 21 වෙනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන පරිදි එවිය යුතුයි.

3. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අදාළ වැටුප් ක්‍රමය රුපියල් 3,420 වාර්ෂික වැටුපෙන් පටන්ගෙන රුපියල් 120 වාර්ෂික වැඩිවීම් 4 කින් ද, රුපියල් 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් හා අනතුරුව රුපියල් 240 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් පසුව රුපියල් 6,780ක වාර්ෂික වැටුප දක්වා වැඩි වේ. (රුපියල් 4,080, රුපියල් 4,800 සහ රුපියල් 5,580 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්)

4. **බඳවා ගැනීමේ කොන්දේසි.**—මේ තනතුර විශ්‍රාම වැටුප් රහිත ස්ථිර තනතුරකි. පත්වීම තුන් අවුරුදු පරීක්ෂණ කාලසීමාවකට යටත් වේ. දැනට ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—
   (අ) සෑම අයදුම්කරුවෙක් ම 1964 පෙබරවාරි මස 21 දිනට වයස අවුරුදු 25 ට අඩු නො විය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අය කෙරෙහි උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)
   (ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ සමාන, එසේ නැතහොත් ඊට උසස් වෙනත් විභාගයකින් හෝ සාමාර්ථයක් ලබා සිටිය යුතුයි. අපේක්ෂකයා සිංහල මාධ්‍ය යෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයකු වන විට ජ්‍යෙෂ්ඨ පාඨ ශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ සමාන වෙනත් විභාගයකින් හෝ සිංහල භාෂා විෂයයෙන් නැතහොත් ඊට සමාන වෙනත් විෂයයකින් සාමාර්ථයක් ලබා තිබිය යුතුයි. (1961 ජනවාරි 1 දිනට පෙර දිනක සිට රජයේ සේවයේ නියුක්තව සිට රජයේ සේවයේ වෙනත් තනතුරු වලට පත්වීමට අපේක්ෂා කරන නිලධාරීන්ට මෙම අවශ්‍යතාවය අදාළ නොවනු ඇත) රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය අතිරේක සුදුසුකමක් හැටියට ගණන් ගනු ලැබේ.
   (ඇ) භාත්ඛන්ඩ සංගීත ආයතනයේ ගායනය පිළිබඳ සංගීත උපාධි යක් හෝ ඉන්දියාවේ පිළිගත් සංගීත ආයතනයක ගාය නය පිළිබඳ සමාන සහතිකයක් තිබිය යුතුයි.
   (ඈ) විශාරද උපාධිය ලැබීමෙන් පසු අවුරුදු 5 ක ගායනය පිළිබඳ ඉගැන්වීමේ පළපුරුද්දක් අඩුම වශයෙන් තිබිය යුතුයි.
   (ඉ) ඛ්‍යාල් ගායනයෙහි විශෙෂඥයකු විය යුතු අතර ධමාර්, ධ්‍රැපද්, ටුම්රි, ටප්පා යනාදී උතුරු ඉන්දීය ගායනය ශෛලීන් පිළිබඳ පරිචයක් හා ජනකවි පිළිබඳ දැනීමක් ද අවශ්‍ය වේ.
   (ඊ) දක්ෂ ගායකයකු විය යුතුයි.
   (උ) විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුයි.

6. අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් ලිය කියවිලිවල පිටපත් අමුණා එවිය යුතුයි.—
   (අ) ලබා ඇති උසස් ම අධ්‍යාපනික, ශාස්ත්‍රීය හා වෘත්තීය සහතික
   (ආ) අයදුම්කරුවන්ගේ චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික 3 ක් (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍ය ය.)

7. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලැබ, නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම් පත් ගැන සළකා බලන්නේ ඒවා නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී ඇත්නම් හා ප්‍රමාදයට සෑහෙන හේතු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගත යුතු ය යි නිර්දේශ කරන්නේ නම් පමණි.

8. අයදුම් පත් මගේ නමට මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ නමට හෝ නොව "අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික කලායතනය, හෝර්ටන් පෙදෙස, කොළඹ" කියා එවිය යුතුයි. යම් ඉල්ලුම්කරුවකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත්, අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බල පැවැත්වීමකට උත්සාහයක් දැරුවහොත් ඒ හේතුවෙන් ම එකී අයදුම්කරුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

9. අයදුම්කරුවන් යම්කිසි නියමිත ස්ථානයක දී සහ වේලාවක දී සුදුසු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය වනු ඇත. ඉල්ලුම් පත්වලට අමුණා එවන ලද සහතික පිටපත්වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු යි. පරීක්ෂණය සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා හෝ ගෙවනු නො ලැබේ.

10. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පටන් ගැන්මෙහි ඇති රාජ්‍ය සේවා තනතුරු පත්වීම් සඳහා අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

11. සියලුම අයදුම් පත් ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

ගාමිණී විජයවර්ධන,
වැඩබලන අධ්‍යක්ෂ.

1964 පෙබරවාරි 7 වැනි දින,
කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ,
ශ්‍රී ලංකා ජාතික කලායතනයේදී ය.

## ශ්‍රී ලංකා ජාතික කලායතන දෙපාර්තමේන්තුව

### ගායනය පිළිබඳ කථිකාචාර්ය තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. (අ) 1964 පෙබරවාරි 21 වෙනි දාට වයස :—
   අවු :——, මාස :——, දින :——.
   (ආ) උපන් දිනය :————.
   (දැන්වූ විටක උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුයි.)
4. ජාතිය :————.
5. උපන් ස්ථානය :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි)
7. ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
8. පළපුරුද්ද :————.
9. දැනට රජයේ සේවයේ නම් ඒ පිළිබඳ විස්තර :————.
10. චරිත සහතික ලබාගෙන ඇති පුද්ගලයින්ගේ නම්, තනතුරු හා ලිපිනයවල් :————.

මේ අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බව ද, නිවැරදි බව ද, මෙයින් සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණහොත් මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බව ද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නො ගෙවා සේවයෙන් පහ කරනු ලබන බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–143—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### (තෙල් කැවීමේ යන්ත්‍රාගාර) ෆෝර්මන් තනතුර

මේ දෙපාර්තමේන්තුවේ ෆෝර්මන් තනතුරකට ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ ඉල්ලුම් පත්, කොළඹ 2, තැ. පෙ. අංක 509 දරන තැන වන සංරක්ෂක වෙත 1964 පෙබරවාරි මස 20 වන දින හෝ ඊට පෙර හෝ ලැබෙන ලෙස එවිය යුතුය.

2. වැටුප් ක්‍රමය.—වර්‍ෂයකට රු. 1,320—72—රු. 2,184.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර සථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—හැම අයදුම්කරුවෙක් ම—

(අ) 1964 පෙබරවාරි මස 20 වන දිනට වයස අවුරුදු 20ට නොඅඩු බවත් 45ට නොවැඩි බවත්, (අන්‍ය අන්දමට සුදුසුකම් ලබා සිටින දැනටමත් රජයේ සේවයේ සිටින නිලධාරීන් කෙරෙහි ඉහළ වයස් සීමාව බල නොපායි).

(ආ) ලංකා කාර්මික විද්‍යාලයයේ කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සන්ධ්‍යා පංති සහතික පත්‍රය දැරිය යුතු අතර වැද්දුම්, බොයිලේරු හා කාර්මික වැඩ ගැන විශේෂ සම්බන්ධයක් ඇති පිළිගත් කර්මාන්ත ශාලාවක දෑවුරුදු පළපුරුද්දක් ලබා තිබිය යුතුය, හෝ

(ඇ) වැද්දුම්, බොයිලේරු හා කාර්මික වැඩ ගැන විශේෂ සම්බන්ධයක් ඇති පිළිගත් කර්මාන්ත ශාලාවක පස් අවුරුදු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

5. **සේවා කොන්දේසි.**—

(i) පත්වීම කරනුයේ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්වය.

(ii) සථිර ලේකම් විසින් නිගමනය කරනු ලබන ක්‍රමයට හා ගණනට අනුව ඇපයක් තැන්පත් කරන ලෙස තෝරා ගත් අයදුම්කරුවනට නියම කිරීමට ඉඩ ඇත.

6. අයදුම්කරුවන් සිය ඉල්ලුම්පත්වලට පහත දක්වන ලිපි ලේඛනවල පිටපත් (මුල් ලිපි නොවේ) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති ඉහළම අධ්‍යයන හා වෘත්තීය සහතික පත්‍රය,

(ඇ) තනතුරට පත්කිරීම පිණිස අයදුම්කරුගේ ඇති සුදුසුකම්, චරිතය, හා යෝග්‍යතාවය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික පත් දෙකක් (දැනටමත් රජයේ සේවයේ සිටින අයදුම් කරුවන් මේ උප වගන්තිය යටතේ සහතික පත් ඉදිරිපත් කළ යුතු නැත.)

7. සම්මුඛ පරීක්ෂණයක් සඳහා මේ කාර්යාලයයට පැමිණෙන ලෙස අයදුම්කරුවනට නියම කෙරෙනු ඇත. ඒ සඳහා වන වියදම් ඔවුන්ම දැරිය යුතුයි.

8. මේ ගැසට් පත්‍රයේ I වන භාගයේ දෙවන කොටසේ පළවන රජයේ සේවයේ තනතුරුවලට අදාල පොදු කොන්දේසි බලන්න.

වන සංරක්ෂක වෙනුවට.

කොළඹ 2,
තැ. පෙ. අංක 509 දරන තැන,
වන සංරක්ෂකගේ කාර්යාලයේ දීය.

### ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) ගේ නම :————.
   (ආ) අනිකුත් නම් :————.

2. ලිපිනය :————.

3. වයස සහ උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

4. ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන්ද ලියාපදිංචි කිරීමෙන්ද ? : ————.

5. දැනට දරන තනතුර සහ ලබන වේතනය :————.
   (රක්ෂාවක නියුක්ත නම්)

6. දැන්වීමෙහි ඉල්ලා ඇති පරිදි තමාට ඇති අධ්‍යාපනික, කාර්මික සහ අනිකුත් සුදුසුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

7. විශෙෂ සුදුසුකම් ඇතිනම් ඒවා :————.

8. චරිත සහතික පත් ලබාගත් පුද්ගලයින් දෙදෙනාගේ නම් සහ ලිපිනය :————.
   (සහතිකවල පිටපත් පමණක් අමුණා එවන්න).

මේ අයදුම් පතෙහි මවිසින් සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. තවද. මෙහි ඇති ඇතැම් කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැන ගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වන බවත්, පත් කරනු ලැබුවායින් පසු හෙළි වුවහොත් කිසිම වන්දියක් නැතිව මා සේවයෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–227/1—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### උදුනේ පදම් කිරීම පිළිබඳ නිලධාරි තනතුර

මේ දෙපාර්තමේන්තුවේ උදුනේ පදම් කිරීම පිළිබඳ නිලධාරි තනතුරකට ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වන ආකෘති පත්‍රය අනුව පුල්ස්කැප් කොළයක පිළියෙල කළ ඉල්ලුම් පත් කොළඹ 2, තැ. පෙ. අංක 509 දරන තැන වන සංරක්ෂක වෙත 1964 පෙබරවාරි මස 20 වන දින හෝ ඊට පෙර හෝ ලැබෙන ලෙස එවිය යුතුය.

2. **වැටුප් හා සේවා කොන්දේසි.**—මේ තනතුරට අදාළ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,860—120—රු. 3,780ක් වේ. පත්වීම මුලින්ම කරන්නේ තුන් අවුරුදු පරීක්ෂණ කාලයකට යටත්වය. තෝරා ගත් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් අනුගමනය කළ යුතුය.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර සථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—හැම අයදුම්කරුවෙක් ම—

(අ) 1964 පෙබරවාරි මස 20 වැනි දිනට තමාගේ වයස අවුරුදු 35ට නොවැඩි බවද (දැනටමත් රජයේ සේවයේ ඇති අයට වයස් සීමාව බල නොපායි).

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුතු බවද,

(ඇ) යටත් පිරිසෙයින්, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව විෂයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් බව හා ලංකා කාර්මික විද්‍යාලයයේ කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ දෑවුරුදු පාඨමාලාව (සන්ධ්‍යා පංති) අනුගමනය කර ඇති බවද, සතුටුදායක ලෙස ඔප්පු කළ යුතුය. ගොඩනැගිලි තැනීම පිළිබඳ දැනුමක් ඇත්නම් එය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ඇත.

5. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදුව, නියමිත දිනට පසුව මෙම කාර්යාලයයට ලැබෙන අයදුම් පත්, එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර හෝ ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් එම අයදුම් පත් පිළිගත යුතු බව නිර්දේශ නොකළහොත් ඒවා ගැන සලකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් සිය ඉල්ලුම්පත්වලට පහත සඳහන් ලිපි ලේඛනවල පිටපත් (මුල් ලිපි නොවේ) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති ඉහළම අධ්‍යයන හා වෘත්තීය සහතික පත්‍ර,

(ඇ) තනතුරට පත්කිරීම පිණිස අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, හා යෝග්‍යතාවය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික පත් තුනක් (දැනටමත් රජයේ සේවයේ සිටින අයදුම්කරුවන් මේ උපවගන්තිය යටතේ සහතික පත් ඉදිපත් කළ යුතු නැත.)

7. සම්මුඛ පරීක්ෂණයක් සඳහා මේ කාර්යාලයයට පැමිණෙන ලෙස අයදුම්කරුවනට නියම කරනු ඇත. ඔවුන් එසේ පැමිණිය යුත්තේ තමන්ගේම වියදමිනි.

8. මේ ගැසට් පත්‍රයේ I වන භාගයේ දෙවන කොටසේ පළවන රජයේ සේවයේ තනතුරුවලට අදාල පොදු කොන්දේසි බලන්න.

වන සංරක්ෂක වෙනුවට.

කොළඹ 2,
තැ. පෙ. අංක 509 දරන තැන,
වන සංරක්ෂකගේ කාර්යාලයේ දීය.

## ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) ගේ නම :————.
   (ආ) අනිකුත් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) 1964 පෙබරවාරි 20 වන දිනට නියම වයස :—
   වර්ෂ :——, මාස :——, දින :——.
   (ආ) උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
4. ලාංකිකවනුයේ පරම්පරාවෙන්ද ලියා පදිංචි කිරීමෙන්ද ? : ————.
5. අයදුම්කරු විවාහකද අවිවාහකද ? :————.
6. ඉගෙන ගත් පාඨශාලා හා අස්වූ දිනය :————.
7. අධ්‍යාපනික සුදුසුකම් :————.
8. පළපුරුද්ද :————.
9. පාසලින් අස්වූ දින සිට කරන ලද රක්ෂා හා රජය යටතේ සේවය කරන ලද නම් සම්පූර්ණ විස්තර :————.
10. විශෙෂ සුදුසුකම් ඇත්නම් විස්තර :————.
11. චරිත සහතික පත් ලබාගත් පුද්ගලයින්ගේ නම් හා ලිපිනය : ————.
    (එබඳු සහතිකවල පිටපත් (මුල් ලිපි නොවේ) ඇමිණිය යුතුය).
12. දැනට රක්ෂාවක් කරන්නේ නම් විස්තර :————.

මේ අයදුම් පතෙහි මවිසින් ඉදිරිපත් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. තවද, මෙහි ඇතුලත් කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැන ගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වන බවත්, පත් කරනු ලැබුවායින් පසු හෙළි වුවහොත් කිසිම වන්දියක් නැතිව මා සේවයෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–227/2—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

### III වැනි ශ්‍රේණියේ සිංහල භාෂා පරිවර්තක තනතුර

පළාත් පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ සිංහල භාෂා පරිවර්තක තනතුර සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අයදුම්කරුවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. ඉල්ලුම් පත්‍ර, මීට යටින් ඇති ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1964 පෙබරවාරි මස 20 වැනි දිනට හෝ ඊට පළමු, කොළඹ, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

3. වැටුප :—මේ තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2.820 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමක් සහිත රු. 1,620—120—රු. 3,780 කි.

4. **සේවා නියමයන් :**—පුරුෂ පක්ෂයේ අයදුම්කරුවන් සඳහා තනතුර විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම, පළමුවරට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. කාන්තාවක් තෝරාගනු ලැබුවහොත්, ඇය පළමුවරට අර්ථසාධක අරමුදලක් පදනම් කරගෙන පත්කරනු ලබන අතර, තුන් අවුරුදු වැඩ පරීක්ෂණයකට යටත්ය. අවුරුදු 10 ක සේවය සම්පූර්ණ කිරීමට පළමු ඕනෑම අවස්ථාවක විශ්‍රාම වැටුප් සහිත සේවයට ඇතුළුවීමේ මනාපය පළ කිරීමට ඔවුනට හිමිකම් ඇත. වැඩ පරීක්ෂණ කාලය තුළ දී මේ මනාපය පළ කරන අය, ඉන්පසු පරිවාස සේවා කාලයක් මතට පමුණුවනු ලැබේ. පරිවාස සේවා කාලය තුන් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයේ නොගෙවී ඇති කාලයට සමාන වේ.

5. **අවශ්‍ය සුදුසුකම් :**—ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම අයත් විය හැකි අයදුම්කරුවන්—

(අ) හොඳ චරිතයෙන් යුත් ලාංකිකයන් වියයුතු අතර,

(ආ) පහත සඳහන් විභාග වලින් සමත් වී සිටිය යුත්තාහ :—

(i) ලංඩන් විශ්ව විද්‍යාලයයේ පොදු අධ්‍යයන සහතික පත්‍රය (උසස් පෙළ) සිංහල හෝ දෙමළ හෝ ;

(ii) සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් සමත් උසස් පාඨශාලා සහතික පත්‍රය (විශෙෂ සිංහල හෝ විශෙෂ දෙමළ නොවේ) හෝ

(iii) සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් ගෙන සමත් වූ අන්තර්මධ්‍යම/කලා පිළිබඳ පළමුවැනි විභාගය/කලා පිළිබඳ සාමාන්‍ය සුදුසුකම් ලැබීමේ විභාගය හෝ ;

(iv) සිංහල හෝ දෙමළ ප්‍රවීණතා (උසස් පෙළ) පරීක්ෂණය ඇතුළුව පහත සඳහන් සුදුසුකම් වලින් එකක් :—

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකයේ හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ලබා ගන්නා අවස්ථාවෙහි හෝ ඊට පසු අවස්ථාවක පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේ දී (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සහිත සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ;

(ii) කවර මාධ්‍යයක වුවද, තවත් විෂයයන් පහකින් සාමාර්ථ්‍යය ද ඇතුළුව ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සහිත පොදු අධ්‍යාපන සහතිකය.

**සටහන :**—පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේ දී සාමාර්ථ්‍යය ලැබිය යුතු විෂයයන් හය එකම අවස්ථාවක දී සමත්ව තිබිය යුතුය.

(ඇ) වයස අවුරුදු 19 ට නොඅඩු අවුරුදු 25ට නොවැඩි විය යුතුයි. රජය යටතේ දැනටමත් ස්ථිර තනතුරු දරන්නේ නම්, ඉහළ වයස් සීමාව අවුරුදු 45 වේ.

**සටහන :**—(i) පාලි සහ/හෝ සංස්කෘත යන භාෂා පිළිබඳ මනා දැනුම අතිරේක සුදුසුකමකි.

(ii) පළාත් පාලන සේවයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන පරිවර්තන කටයුතුවල යෙදී සිටින සාමාජිකයන්ගේ අයදුම් පත්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

6. අයදුම්කරුවන්ගේ පහත සඳහන් ලියවිලිවල **පිටපත් පමණක්** අයදුම්පත්වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බවුතීස්ම සහතිකය හෝ අධ්‍යාපන නීති පද්ධතිය වෙනුවෙන් නිකුත් කරන ලද සහතික නොපිළි ගැනේ.) ;

(ආ) අධ්‍යාපනික සුදුසුකම් හා විශේෂ හිමිකම් ඔප්පු කරන සහතිකය (පස්වැනි ඡේදයේ (i) වැනි සටහන බලන්න.) ;

(ඇ) අලුත ලබාගත් චරිත සහතික 2ක් (සහතික හෝ චරිත සහතිකවල පිටපත් ආපසු එවනු නොලැබේ.)

7. ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන සේවයේ සිටින තැනැත්තන්ගේ අයදුම් පත් ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හෝ ප්‍රාදේශීය බලමංඩලයක නම්, සභාපති හෝ කොමසාරිස් මගින් ඉදිරිපත් කළ යුතුයි. අයදුම්කරුගේ රාජකාරිවල ස්වභාවය සඳහන් කරන අතර, ඔහු පරිවර්තන රාජකාරි ඉටුකරන බව දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සභාපතිවරුන් හා කොමසාරිස්වරුන් විසින් සහතික කළ යුතු අතර, තෝරාගනු ලැබුවහොත්, මුදා හැරිය හැකිද යනු ද සඳහන් කළ යුතුයි.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ **පෞද්ගලික නමට නොවේ.**

9. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. කොළඹ දී පැවැත්වෙන පරීක්ෂණයකට පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කළ හැකිය. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් ආදී කිසිම වියදමක් නොගෙවනු ලැබේ.

11. සුදුසුකම් සහිත ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

12. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයෙහි පළකර තිබෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1964 ජනවාරි මස 29 වැනි දින,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530, කොළඹ.

පළාත් පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

**III වැනි ශ්‍රෙණියේ සිංහල භාෂා පරිවර්තක තනතුර සඳහා අයදුම් පත්‍රයයි**

1. දන්වීමේ සම්බන්ධය :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරින් :————.
   ජාතිය :————.

3. සම්පූර්ණ තැපැල් ලිපිනය :————.

4. අයදුම්කරු උපන් දිනය සහ ස්ථානය :————.
   (අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් අමුණා එවිය යුතුයි.) (දිවුරුම් පෙත්සම්, බෞතිස්ම සහතික හෝ අධ්‍යාපන කටයුතු සඳහා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලේඛනයෙන් උපුටාගත් සහතික කරන ලද කොටස් හෝ නොපිළිගැනේ.)

5. අයදුම්කරුගේ පියාගේ උපන් දිනය හා ස්ථානය :————.

6. විවාහකද, අවිවාහකද :————.

7. අධ්‍යාපනික සුදුසුකම් හා අවසාන වරට සමත් වූ විභාගය, දිනයත් සමග (සහතික පිටපත් අමුණා එවිය යුතුයි.) :—
   (අ) ඉංග්‍රීසි :————.
   (ආ) සිංහල :————.

8. අධ්‍යාපනය ලැබූ ස්ථානය හා පාසලින් අස්වූ දිනය :————.

9. (අ) දින වකවානු හා සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව පාසලින් අස්වූ දින සිට කළ රක්ෂාව :————.
   (ආ) මීට කලින් ආණ්ඩුවේ යටතේ සේවය කළේ නම් සේවය නතර කිරීමේ හේතුවත් සමග සේවය පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.
   (ඇ) පළාත් පාලන සේවා සාමාජිකයකු නම්—
      (i) දැනට දරන තනතුරේ නම හා ශ්‍රේණිය :————.
      (ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.
      (iii) පළාත් පාලන මණ්ඩලවල සේවය පිළිබඳ වාර්තා සටහන :————.
   (ඈ) සේවා මුක්ත භටයකු නම්—
      සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

10. විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.
    උදා : වෘත්තීය හා ශිල්පීය ආදී වශයෙන්.

11. චරිත සහතික ලබාගෙන ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම (සහතික පිටපත් පමණක් ඇමිණිය යුතුය) :————.

12. විශේෂ හිමිකම් ආදීයත් පිළිබඳ විස්තර :————.
    (උදා : අයදුම්කරු ඉල්ලුම් කර සිටින සවභාවයේ තනතුරක ඇති පළපුරුද්ද)

13. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි සවභාවය සඳහන් කරන්න :————.

14. පළාත් පාලන සේවය යටතේ සේවය කළේද එසේ නම් කිසියම් අවස්ථාවක සේවය නතර කරනු ලැබුවේද ? :————.

15. ණයතුරුස් වලින් හෝ මුදල් කරදරවලින් නිදහස් ද :————.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත්, එසේ අනාවරණය වූයේ තෝරාගනු ලැබීමට පළමු නම් එයින් මා නුසුදුස්සකු වන බවත් පත් කිරීමෙන් පසුව නම් වන්දියක් නැතිව සේවයෙන් පහකරනු ලැබිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ.

2–113—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12/1(ජී).

**ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ ලඝු ලේඛකයන් සඳහා 1963 ඔක්තෝබර් මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) විභාගය**

1963 ඔක්තෝබර් 11 සහ 12 වැනි දිනවල පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී, ප්‍රවාසන/පරීක්ෂණ කාලවලට යටත් ව පත්වීම් ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයන්/ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දැනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| එදිරිසිංහ, ජේලා. ශ්‍රෙ. (මහත්මිය) | දේශීය ආදායම් | ලඝු ලේඛනය |
| එදිරිවීරසිංහ, ජෝ. බෙ. | ඉඩම් සංවර්ධන | ලඝු ලේඛනය |
| කනගලින්ගම්, වෛ. | නගර හා ග්‍රාම නිර්මාණ | ලඝු ලේඛනය |
| කෘස්, මා. ටි. ලූ. නෝ. (මෙනෙවිය) | පොලිස් | ලඝු ලේඛනය |
| ගුණරත්නම්, සු. ස. | කම්කරු | දෙමළ |
| ගුණරත්න, ප. රූ. (මහත්මිය) | රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානය | සිංහල |
| ගුණරත්න, මී. ඇ. බී. | වෙළඳ සමාගම් | සිංහල |
| ඩේවිඩ්, රෙ. ජේලා. ඒ. අ. (මෙනෙවිය) | දේශීය ආදායම් | ලඝු ලේඛනය |
| ද සොයිසා, සො. මා. (මහත්මිය) | ගොවිජන සේවා | ලඝු ලේඛනය |
| ද සිල්වා, යො. සි. ශ්‍රී. (මෙනෙවිය) | තැපැල් | සිංහල |
| පෙරේරා, ම. දෙ. ජෙ. | තැපැල් | සිංහල |
| පෙරේරා, ව. නී. හෙ. | දුම්රිය | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, හේ. වි. | රජයේ විදුලි කර්මාන්ත | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, ලෙ. කැ. හ. | හලාවත, මහේස්ත්‍රාත් උසාවිය | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, ජෝ. ඇ. ඉ. | මුදල් අමාත්‍යාංශය | ලඝු ලේඛනය |
| ෆර්දිනන්දු, ඇ. කං. සෙ. (මහත්මිය) | ආනයන හා අපනයන පාලන | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, මෙ. කො. (මහත්මිය) | ආනයන හා අපනයන පාලන | සිංහල |
| ප්‍රනාන්දු, වී. ක්‍රි. (මහත්මිය) | ජාතික නිවාස | ලඝු ලේඛනය |
| මැන්දිස්, එ. තෙ. ඔ. (මහත්මිය) | පොලිස් | ලඝු ලේඛනය |
| මොහමඩ්, මො. හ. සැ. | දේශීය ආදායම් | ලඝු ලේඛනය හා සිංහල |
| රහුමාන්, සි. ක. අ. (මෙනෙවිය) | සෞඛ්‍ය | ලඝු ලේඛනය |
| රූපසිංහ, ගු. එ. | රාජ්‍ය ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශය | සිංහල |
| රිචඩ්ස්, කැ. සු. (මහත්මිය) | අලෙවි කිරීමේ | සිංහල, ලඝු ලේඛනය හා ඉංග්‍රීසි |
| වික්‍රමසූරිය, ආ. | සෞඛ්‍ය | ලඝු ලේඛනය |
| වීරසේකර, වී. මු. න. | තැපැල් | ලඝු ලේඛනය |
| සෙනෙවිරත්න, වා. ජ. මූ. රො. ක්ලෝ. ර. | ගුවන් විදුලි හා ප්‍රවෘත්ති | ලඝු ලේඛනය |
| හසිම්, ස. දූ. මු. | කුලියාපිටියේ මහේස්ත්‍රාත් උසාවිය | ලඝු ලේඛනය |

2. පහත සඳහන් නිලධාරිහු පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සම්පූර්ණ වශයෙන් දුන් සමර්ථ වී ඇත්තාහ :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| එදිරිවීරසිංහ, ජෝ. බෙ. | ඉඩම් සංවර්ධන |
| කනගලින්ගම්, වෙ. | නගර හා ග්‍රාම නිර්මාණ |
| කෲස්, මා. ටි. ලු. නෝ. (මෙනෙවිය) | පොලිස් |
| ඩේවිඩ්, රෙ. ෆේජ්ලා. එ. අ. (මෙනෙවිය) | දේශීය ආදායම් |
| ද සොයිසා, සො. මා. (මහත්මිය) | ගොවිජන සේවා |
| සිල්වා, යො. සි. ශ්‍රී. (මෙනෙවිය) | තැපැල් |
| පෙරේරා, ව. නී. හෙ. | දුම්රිය |
| ප්‍රනාන්දු, ලෙ. කැ. හ. | හලාවත මහෙස්ත්‍රාත් උසාවිය |
| ප්‍රනාන්දු, ජෝ. ඇ. ඉ. | මුදල් අමාත්‍යාංශය |
| ෆර්දිනන්දු, ඈ. කා. සෙ. (මහත්මිය) | ආනයන හා අපනයන පාලන |
| ප්‍රනාන්දු, වී. ක්‍රි. (මහත්මිය) | ජාතික නිවාස |
| මැන්දිස්, එ. නෙ. ඔ. (මහත්මිය) | පොලිස් |
| රහුමාන්, සි. ක. අ. (මෙනෙවිය) | සෞඛ්‍ය |
| රිචර්ඩ්ස්, ඤැ. සු. (මහත්මිය) | අලෙවි කිරීමේ |
| වික්‍රමසූරිය, ආ. | සෞඛ්‍ය |
| වීරසේකර, වී. මු. න. | තැපැල් |
| සෙනෙවිරත්න, වා. ජ. මු. රො. ක්ලෝ. ර. | ගුවන් විදුලි හා ප්‍රවෘත්ති |
| හසිම්, ස. දු. මු. | කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවිය |

1964 ජනවාරි 27 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

2–198/1—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1(ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් (ඉංග්‍රීසි) විභාගය—1963 ඔක්තෝබර

1963 ඔක්තෝබර 11 වැනි සහ 12 වැනි දිනවල පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940 ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩ-ඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛකයන් හා ලඝු ලේඛිකාවන් ද ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථව් ඇති බව මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| දේවපාලන්, ලි. පූ. (මහත්මිය) | ධීවර | ලඝු ලේඛනය |
| ධනපාල, ක. සු. (මහත්මිය) | මහා භාණ්ඩාගාරය | ලඝු ලේඛනය |
| නුගේරා, හි. අ. | සෞඛ්‍ය | සිංහල, ඉංග්‍රීසි හා ලඝු ලේඛනය |
| පෙරේරා, දෙ. රේ. හෙ. රෙ. | ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශය | ඉංග්‍රීසි හා සිංහල |
| මුඩගම්මන, ප. පු. බ. | කෘෂිකර්ම | ඉංග්‍රීසි |
| ලුඩකින්ස්, අ. මෝ. (මහත්මිය) | මහා භාණ්ඩාගාරය | සිංහල, ඉංග්‍රීසි හා ලඝු ලේඛනය |
| හෙන්රි, දී. ල. | සමාජ සේවා | ඉංග්‍රීසි |

2. පහත සඳහන් අපේක්ෂකයන් හා අපේක්ෂිකාවන් ද සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීම සඳහා දුන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| දේවපාලන්, ලි. පූ. (මහත්මිය) | ධීවර |
| ධනපාල, ක. සු. (මහත්මිය) | මහා භාණ්ඩාගාරය |
| නුගේරා, හි. අ. | සෞඛ්‍ය |
| පෙරේරා, දෙ. රේ. හෙ. රෙ. | ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශය |
| මුඩගම්මන, ප. පු. බ. | කෘෂිකර්ම |
| ලුඩකින්ස්, අ. මෝ. (මහත්මිය) | මහා භාණ්ඩාගාරය |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩ-ඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද, එම පරීක්ෂණයට ඇතුළු වීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතු ය.

1964 ජනවාරි 27 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩබලන නියෝජ්‍ය ලේකම්.

2–198/2—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1(ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛකයන් සඳහා වූ විශේෂ කාර්යක්ෂමතා කඩ-ඉම් (ඉංග්‍රීසි) විභාගය—1963 ඔක්තෝබර

1963 ඔක්තෝබර 11 සහ 12 වැනි දිනවල පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940 ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩ-ඉමෙන් උසස් කිරම සඳහා සුදුසුකම් ලැබීමේ විශේෂ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛකයන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය |
|---|---|---|
| ඇඩම්ස්, ඩ. බැ. | රාජ්‍ය ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශය | ලඝු ලේඛනය |
| ගුණරත්න, ක. දී. පි. | දේශීය ආදායම් | ඉංග්‍රීසි |

2. පහත සඳහන් අපේක්ෂකයා සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීම සඳහා දුන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ඇඩම්ස්, ඩ. බැ. | රාජ්‍ය ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශය |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩ-ඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරියා ද, එම පරීක්ෂණයට ඇතුළු වීම සඳහා සුදුසුකම් මීට කලින් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් වහා ම ඉල්ලා සිටිය යුතු ය.

1964 ජනවාරි 27 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

2–198/3—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—හම්බන්තොට උප කොට්ඨාශය

ඌරුබොක්ක ඔය ව්‍යාපාරයේ, හුන්නකුඹුරේ දොර පහේ අමුණක් සෑදීම සඳහා ටෙන්ඩර් පත් 1964 මාර්තු මස 3 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා තංගල්ල, දකුණු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි මස 28 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී හම්බන්තොට වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

රා. මුතුකුමාරසාමි,
වාරිමාර්ග ඉංජිනේරු,
හම්බන්තොට උප කොට්ඨාශය.

හම්බන්තොට,
1964 ජනවාරි මස 30 දින දී ය.

2–181—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මන්නාරම උප කොට්ඨාශය

ව්‍යාඩිකුලම් යෝජනා ක්‍රමය යටතේ ඇති ඉඩම්වලට වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහා ටෙන්ඩර් පත් 1964 මාර්තු 3 වෙනි අඟහරුවාදා, පෙරවරු 10 දක්වා වවුනියාව උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහි දී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 33,500 කට හෝ, ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි 28 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්‍යාල වේලාවන් තුල දී, මුරුංකන් මන්නාරම උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතු යි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී, ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතු ද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැන ගේ කාර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු යි.

4. ටෙන්ඩර් ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්‍යාලීය වේලාව තුළ දී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ඇස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු—මන්නාරම උප කොට්ඨාශය.

මුරුංකන් .
1964 ජනවාරි මස 23 වෙනි දින දීය.

2–180—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වවුනියා උප කොටස

වවුනියා දිස්ත්‍රික්කයේ, ඉලන්කාතකුලම වැඩි දියුණු කිරීම සඳහා 1964.1.17 දින, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1964.1.9 දින දරණ ටෙන්ඩර් දැන්වීම පිළිබඳව අවශ්‍ය ලියාපදිංචි මුදල, දක්වා ඇති පරිදි රුපියල් 25,000 ක් සහ ඉන් ඉහළ නොව රුපියල් 35,000 (දැන්වීමේ 2 වෙනි ඡේදය බලන්න.) සහ ඉන් ඉහළ විය යුතුබව මෙයින් දන්වනු ලැබේ.

වවුනියාව,
1964.1.24.

වී. කුමාරස්වාමි,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
වවුනියා උප කොටස.

2–27—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1963/64 මුදල් වර්ෂය දෙවෙනි භාගය සඳහා අලුත්නුවර ඉඩම් සංවර්ධන නිලධාරි වෙත ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම

මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ ව්‍යාපාරයට පහත දැක්වෙන ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් වූ ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මාසයේ 26 වැනි දින පස වරු 2 වන තෙක් අලුත්නුවර ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් බාරගනු ලැබේ.

(1) පොල් අතු (ඉරු දෙක බැගින් යුත් දිගින් අඩි 7 ටත් පළලින් අඟල් 18 ටත් නො අඩු ඒවා විය යුතුයි. සැපයීම දහස් ගණනිනි) ;

(2) තම්බාපු හුණු (බුසල්වලින්) ;

(3) අලු හුණු (බුසල් ගණනින් සැපයිය යුතුයි. බුසලක් රාත්තල් 44 ක් නොඅඩු විය යුතුයි) ;

(4) 6″×9″ කලුගල් (කියුබ් ගණනින්) ;

(5) ¾″ සිට අඟල් 2 දක්වා කැටගල් (කියුබ් ගණනින්) ;

(6) පිලිස්සූ ගඩොල් (8¾″×4½″×2¾″) ප්‍රමාණයේ ඒවා විය යුතුයි. සැපයුම දහස් ගණනිනි. ගඩොල් සැපයිය හැකි ස්ථානයේ ව්‍යාපාරයේ සිට සැතැක්ම පහක් ඇතුළත විය යුතුයි ;

(7) ගංගා වැලි (කියුබ් ගණනින්).

2. ඒ ඒ ද්‍රව්‍යයන් දෙපාර්තමේන්තු වාහන මගින් සපයන ස්ථානයේ දිත්, ව්‍යාපාරයේ අංශයන්ටත් සැපයිය හැකි මිල ගණන් වෙන වෙනම දැක්විය යුතුයි.

3. අලුත්නුවර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්‍යාලයේදී හෝ කච්චේරියක හෝ රුපියල් 50 ක් තැන්පත් කළ බැව් දැක්වෙන කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් පෝර්ම 1964.2.22 දින දවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

4. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් බව දන්වා සති දෙකක් ඇතුලත සිට එකී ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීය හැකි විය යුතුයි. අලුත්නුවර ඉඩම් සංවර්ධන නිලධාරි විසින් නිකුත් කරනු ලබන ඇනවුම් අනුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එකී ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම අපහසු වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුල් කිරීමටද ඉඩ තිබේ.

5. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් ටෙන්ඩර් විවෘත කරන දින යේ දී, එනම් 64.2.26 වැනි දින පස්වරු 2 ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධව වැඩිමනත් විස්තර අලුත්නුවර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබාගත හැක.

ඊ. ඩබ්ලිව්. ඇම්. පෙරේරා,
ඉඩම් සංවර්ධන නිලධාරි,
අලුත්නුවර.

29.1.64 දින වේරගන්තොට, අලුත්නුවර,
ඉඩම් සංවර්ධන කාර්‍යාලයේදීය.

2–188—64.2. 7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සම්පූර්ණයෙන් ඇට ඉවත් කළ මිරිස් පොතු විකිණීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍යම ගබඩාවේ ගබඩා කර ඇති, සම්පූර්ණයෙන් ඇට ඉවත් කරන ලද, ඉතා හොඳ වර්ගයේ මිරිස් පොතු රාත්තල් 6384 ක් මිලදී ගෙන ඉවත් කර ගෙන යාම සඳහා ටෙන්ඩර ඉල්ලුම් පත් 1964.2.24 වැනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍යම ගබඩාවේ සම්බන්ධතා නිලධාරි තැන වෙතින් ලබා ගන්නා ලද, ටෙන්ඩර් ඉල්ලුම් පත් වල සියලුම ටෙන්ඩර් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුවේ. ටෙන්ඩර් ඉල්ලුම් පත් පිටපත් දෙකකින් යුක්තව, සීල් තබන ලද කවරයක බහා, ලියාපදිංචිකළ තැපැලෙන් එවිය යුතු අතර කවරයේ වම් පස මුදුන් කෙළවරේ "මිරිස් පොතු මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් දැක්විය යුතුය. ලියාපදිංචි තැපැලෙන් නොඑවන ටෙන්ඩර් ඉල්ලීම් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත නියමිත දින නියමිත වේලාවට කලින් අතින් භාර දුන්නාට වරදක් නොමැත.

3. සියලුම ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් විසින් ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගැනීමේදී ඒ සඳහා ඇප මුදල් වශයෙන් රුපියල් 10 ක් මධ්‍යම ගබඩා භාර සම්බන්ධතා නිලධාරි වෙත හෝ ඕනෑම දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයක හෝ පේරාදෙණියේ ප්‍රධාන කාර්යාලයේ හෝ තැන්පත් කර, ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි. තෝරා ගන්නා ලද ටෙන්ඩර් ඉල්ලුම්කරු විසින්, ටෙන්ඩරයේ සඳහන් මුළු මුදල එකවර ගෙවා සතියක් ඇතුළත දී මිරිස් පොතු ඉවත් කර ගෙන යා යුතුවේ. තෝරා නොගත් ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමේදී එම මුදල තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුවේ.

4. නියමිත ෆෝර්මයේ ලියා නැති හෝ නියමිත අන්දමින් පැහැදිලි ලෙස සම්පූර්ණ කර නැති ටෙන්ඩර් ඉල්ලීම් ඉවත දැමීමට සිදුවේ. ඉල්ලුම් පත්‍රයේ කරන සෑම සංශෝධනයකටම කෙටි අත්සන යෙදිය යුතුය.

5. යම් කිසි ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ කොටසක් පිළිගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත පැවරෙනු ඇත.

6. ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකින්වත් නොවෙනස් වන ස්ථිර ඒවා විය යුතුය.

7. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින්, ටෙන්ඩරයේ සඳහන් කාර්යයන් සඳහා ලාංකික කම්කරුවන් පමණක් යොදා ගත යුතුයි. පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් පුරවැසි භාවය ලැබූ අය "ලාංකික" ගණයෙහිලා සැලකේ.

8. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම් කිසි කම්කරුවෙකු වැඩට ගැනීම සම්බන්ධව විරුද්ධවීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනී.

9. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ, තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ විරුද්ධ වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

10. වැඩි විස්තර නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍යම ගබඩාවේ සම්බන්ධතා හා භාරකාර නිලධාරි තැන ගෙන් දැන ගත හැකිය.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙණියේදීය, 64. 1. 27.

2–118—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### රත්නපුර දිස්ත්‍රික්කයේ චන්ද්‍රිකාවැව ව්‍යාපාරයට හා සම්බන්ධ නොට දිස්ත්‍රික්කයේ රන්මල්කන්ද, වීරකැටිය-මිද්දෙණිය හා උඩ වලවේ යන ව්‍යාපාරවලට 1963/64 මුදල් වර්ෂයේ දෙවන භාගයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම

ඉහතින් දැක්වෙන ව්‍යාපාරවලට පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් සඳහන් "ටෙන්ඩර්" පත්‍ර 1964 පෙබරවාරි මස 25 දින අ. භා. 3 දක්වා පහත අත්සන් කරන මා විසින් භාරගනු ලැබේ :—

(1) පොල්අතු දිග අඩි 7 ටත් පළල අඩි 1 (අඟල් 12) ටත් අඩු නොවිය යුතුයි. 1,000 ගණනේ ජෝඩු අතු;
(2) අළු හුණු බුසල් ගණනින් (බුසල් එකක් රාත්තල් 44 කට අඩු නොවිය යුතුයි);
(3) තම්බාපු හුණු බුසල් ගණනින්;
(4) කළුගල් කැබලි අඟල් 6×9 කියුබ් ගණනින්;
(5) තලාපු කළුගල් අඟල් ½ කියුබ් ගණනින්;
(6) තලාපු කළුගල් අඟල් ¾ කියුබ් ගණනින්;
(7) තලාපු කළුගල් අඟල් 1 කියුබ් ගණනින්;
(8) තලාපු කළුගල් අඟල් 1½ කියුබ් ගණනින්;
(9) තලාපු කළුගල් අඟල් 2 කියුබ් ගණනින්;
(10) පිළිස්සූ ගඩොල් 1,000 ගණනින් (අඟල් 8¾×අඟල් 4½× අඟල් 2¾ ප්‍රමාණය විය යුතුයි).
(11) වැලි කියුබ් ගණනින්.

2. 1964 පෙබරවාරි මස 25 දින දවල් 12 දක්වා චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල 'ටෙන්ඩර්' පත්‍ර පිළියෙල කොට අනු පිටපත් සමග ඉදිරිපත් කළ යුතුයි. මෙම ටෙන්ඩර් පත්‍ර එක් එක් ව්‍යාපාරයට වෙන් වෙන්ව පිළියෙල කර තිබිය යුතුයි. ටෙන්ඩර් පත්‍රයකට රු. 50 බැගින් ඇප මුදල් චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේ හෝ වෙනයම් දිසාපති කාර්යාලයක තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

3. ටෙන්ඩර් පත්‍රවල පැහැදිලිව මිළ ගණන් සඳහන් කර කවරය වසා සීල් තබා චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ තැපැලෙන් එවනවා නම් ලියාපදිංචිකළ තැපැලෙන් එවිය යුතුයි. සෑම ටෙන්ඩරයක්ම බහා එවන ලියුම් කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි "ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කළ යුතුයි.

4. සාර්ථක ටෙන්ඩර්කරු නියමිත ආකාරයට ද්‍රව්‍ය සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල් රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නම් ලැයිස්තුවටද ඇතුලත් වන්නේ ය.

5. 1964 පෙබරවාරි මස 25 දින පූ. භා. 3.30ට චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට තමන් කැමතිනම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටිය හැක.

6. වැඩි විස්තර චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබාගත හැක.

ග්‍රෙහැම් දිසානායක,
චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන නිලධාරී.

1964.1.29 දින,
කහවත්තේ පදලන්ගල,
චන්ද්‍රිකාවැව ඉඩම් සංවර්ධන කාර්යාලයේදී යැ.

2–189—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් දැන්වීමයි

### මින්නේරි ජල විදුලි ක්‍රමයේ විදුලි බල යන්ත්‍රය සවිකිරීමේ ටෙන්ඩර් සම්බන්ධවයි

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964ක්වූ අප්‍රේල් මස 7 වන අඟහරුවාදා පූ.භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ.පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප්තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5හේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ෆෝර්මවලයි. එහි 1964 ක්වූ අප්‍රේල් මස 3 වන දින අ.භා. 2.00 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1964ක්වූ අප්‍රේල් මස 7 වන අඟහරුවාදා පූ.භා. 10.00ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. ...තුබාලසූරියර්,
වැඩබලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540. කොළඹ 10,
1964ක්වූ පෙබරවාරි මස 7 වන දින දීය.

2–145—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1963/64 මුදල් වර්ෂයේ දෙවන භාගයට, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලේ ඉඩම් සංවර්ධන නිලධාරි යටතේ ඇති අල්ලේ, කන්තලේ, මොරවැව ව්‍යාපාර සහ ඉඩම් සංවර්ධන නිලධාරි ආයතන අංශයේ ගොඩනැගිලිවලට ප්‍රාදේශීය භාණ්ඩ සැපයීම**

පහත දැක්වෙන ප්‍රාදේශීය භාණ්ඩ අල්ලේ, කන්තලේ, මොරවැව ව්‍යාපාර සහ ඉඩම් සංවර්ධන ආයතන අංශයට සැපයීම සඳහා ත්‍රිකුණාමලයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් 1964.2.29 වැනි දින පෙ. ව. 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) වියාපු පොල් අතු (දිග අඩි 7ක් ද පළල 12" ක් ද විය යුතුයි. ඉරු දෙකේ ඒවා 1,000 බැගින්) ;
(2) අලු හුණු බුසල්වලින් (බුසලක් රාත්තල් 44කට වඩා අඩු නොවිය යුතුයි) ;
(3) තම්බාපු හුණු බුසල්වලින් ;
(4) කලුගල් 6"×9" ප්‍රමාණය කියුබ්වලින් ;
(5) තලාපු ගල් කියුබ්වලින් (¾" සිට 2" දක්වා ප්‍රමාණවලට) ;
(6) පුලුස්සාපු ගඩොල් (8¾"×4½"×2¾" ප්‍රමාණයේ 1,000 බැගින්) ;
(7) ගඟේ වැලි කියුබ්වලින්.

2. සැපයීම සඳහා මිළ ගණන් වෙන වෙනම දක්විය යුතුය :—
(අ) වත්තේදී/පෝරනුවේදී/ගල්වලේදී/ලොරි යා හැකි ස්ථාන විය යුතුයි. සැතපුම් 5ක් ඇතුළත විය යුතුයි ;
(ආ) කාර්ය ස්ථානයට.

3. මුදලින් රුපියල් 50 ක් ඒ ඒ ව්‍යාපාර සඳහා වෙන වෙනම මගේ කාර්යාලයේ දී තැන්පත් කිරීමෙන් හෝ කච්චේරියක තැන්පත් කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් අනුමත කරන ලද ටෙන්ඩර් පෝර්ම මගෙන් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම දෙනු ලබන්නේ 1964 පෙබරවාරි 26 දින පෙ. ව. 11 දක්වා පමණි.

4. ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ නියමය පරිදි නියම කරණු ලැබූ ද්‍රව්‍ය ප්‍රමාණය වරින් වර දත්වා දෙසතියක් ඇතුළත සැපයීමට පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුට හැකි විය යුතු අතර මා සමග පොරොන්දු පත්‍රයකටද අත්සන් තබා පොරොන්දුවකට බැඳිය යුතුයි. සැපයීම පැහැර හරින හෝ සැපයීමට අපොහොසත් වන ටෙන්ඩර්කරුවන්ගේ නම් කොන්ත්‍රාත්තු කඩකරන අයගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට සිදුවන අතර තැන්පත් මුදල ද රජය සතු වනවා ඇත.

5. ටෙන්ඩර්කරුවන්ට 1964 පෙබරවාරි 29 දින පෙ. ව. 11ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටිය හැක.

6. වැඩිදුර විස්තර පහත අත්සන් කරන ලද නිලධාරි තැනගෙන් ලබාගත හැක.

පී. සන්ගාරවේල්,
ඉඩම් සංවර්ධන නිලධාරි, ත්‍රිකුණාමලය.

ඉඩම් සංවර්ධන කාර්යාලය,
"කැනන් බෝල් කොටේජ්",
පේදුරු කොටුව,
ත්‍රිකුණාමලය,
1964 ජනවාරි 31 දින දීය.

2–182—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාසලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| 1. හ/රිදියගම විද්‍යාලය | ... | අර්ධ ස්ථිර ගොඩනැගිල්ලක් තැනීම. |
| 2. හ/අඹකොලවැව විද්‍යාලය | ... | එම |
| 3. හ/මුල්ගිරිගල විද්‍යාලය | ... | එම |
| 4. හ/තෙළුල්ල විද්‍යාලය | ... | එම |
| 5. හ/විතාරන්දෙනිය විද්‍යාලය | ... | එම |
| 6. හ/කුඩාවැල්ල විද්‍යාලය | ... | එම |
| 7. හ/කැප්පිටියාව විද්‍යාලය | ... | එම |

**සංලක්‍ෂ්‍යය.**—1. හ=හම්බන්තොට දිස්ත්‍රික්කය.

**සංලක්‍ෂ්‍යය.**—2. අවශ්‍ය ලියා පදිංචි කිරීම :—

| | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව | | අනුමත කළ සමිති සමාගම් |
|---|---|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 1-7. | 10,000.00 | ... | 10,000.00 | ... | 10,000.00 |

2. ඉහත දැක්වෙන දෙවෙනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අයට සහ එම සටහනේ පෙන්වන මුදලකට නොඅඩු ගණනකට ගොඩනැගිලි කළ හැකි බවට සමුපකාර රෙජිස්ට්‍රාර් තුමාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් හෝ සහතිකයක් තංගල්ලේ අධ්‍යාපන නිලධාරි තුමාට ඉදිරිපත් කළ හැකි විවිධ සේවා සමුපකාර සමිතිවලට ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලටද ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින් දා දහවල් 12.00 තෙක් නිකුත් කරනු ලැබේ.

ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්‍ෂතුමාගේ කාර්යාලයේ, ඒ.සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක එම වැඩය සඳහා රුපියල් සියයක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් තංගල්ලේ අධ්‍යාපන නිලධාරිතුමා වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ තංගල්ලේ අධ්‍යාපන නිලධාරි තුමාගෙන් හෝ ලබාගත යුතුයි. මුදල් ගෙවීම් පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත දෙවැනි ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමගය. සියළු විස්තර සහ තොරතුරු තංගල්ලේ අධ්‍යාපන නිලධාරි තුමාගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, තංගල්ල" යන ලිපිනයට රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කරන ලද තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද, ලියා තිබිය යුතුයි.

5. 1964 පෙබරවාරි මස 28 වැනි දින පස්වරු 2.30ට තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද (රේට් ගණන්), ටෙන්ඩර්කරුවන්ගේ නම්ද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තර තංගල්ලේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

8. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන් ය, ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළා සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වෙයි. ලාංකික නොවූ හෝ, ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

සී. ඒ. ජී. ප්‍රනාන්දු,
තංගල්ලේ අධ්‍යාපන නිලධාරි.

1964 ජනවාරි මස 29 වැනි දින,
තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

2–157—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 පෙබරවාරි මස 21 වැනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාර ගනු ලැබේ.

| පාසලේ නම | කළයුතු වැඩය |
| --- | --- |
| 1. කො/බලුගහගොඩ විජිත විද්‍යාලය | ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| 2. කො/ගෝනහේන මහා විද්‍යාලය | කෘෂිකාර්මික විද්‍යාගාරයක් තැනීම |
| 3. මී/බාඳුරාගොඩ මහා විද්‍යාලය | රසායනාගාරයට ජලය සැපයීම |
| 4. මී/බාඳුරාගොඩ මහා විද්‍යාලය | ළිඳ අළුත්වැඩියා කිරීම. |

**සංලක්ෂ්‍යය.**—කො = කොළඹ දිස්ත්‍රික්කය මී—මීගමුව දිස්ත්‍රික්කය.

**සටහන 1.**

| අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව | | | අනුමත කළ සමිති සමාගම් |
| --- | --- | --- | --- |
| අංක. 1 | ... | රු. 12,000.00 | රු. 12,000.00 |
| අංක 2 | ... | රු. 10,000.00 | ,, 10,000.00 |
| අංක. 3 | ... | රු. 6,000.00 | ,, 6,000.00 |
| අංක. 4 | ... | රු. 3,000.00 | ,, 3,000.00 |

2. ඉහත දැක්වෙන පළමුවන සටහන ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවූ අයට සහ ඊට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලිය පදිංචිවී සිටින අනුමත කරනලද විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරු සමුපකාර සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 පෙබරවාරි මස 20 වැනිදා පස්වරු 3.30 වන තුරු නිකුත් කරනු ලැබේ.

3. ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹ 7, ග්‍රීන්පාත්, අධ්‍යාපන කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක අංක 1 සිට 4 වැඩ සඳහා රු. 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක්, කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමන් වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චැක්පත්, මුදල් ඇනවුම, තැපැල් ඇනවුම යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා, අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍රය කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපනාධ්‍යක්ෂතුමා (ගොඩනැගිලි අංශය) හෝ කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර, සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂතුමා ගෙන් ලබා ගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලිය පදිංචිවී ඇති සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. පූර්වෝක්ත දෙවැනි ඡේදයේ සඳහන් වන පරිදි කොළඹ උතුරු, සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තුමාගෙන් ලබා ගත් ටෙන්ඩර් පෝරම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමඟය. සියලුම විස්තර සහ තොරතුරු කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචිකළ තැපෑලෙන් එවිය යුතුයි, ප්‍රදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රය කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නාමද, ලිපිනයද, වැඩෙහි නමද, ලියා තිබිය යුතුය.

6. 1964 පෙබරවාරි මස 14 වැනි දින පෙරවරු 10.30 ට කොළඹ 3, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරනු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද, ටෙන්ඩර් කරුවන්ගේ නම්ද, පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

7. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන්කර සති 6 කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනාව විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර කොළඹ 2, කුමාරන් රත්නම් පාර, කොළඹ උතුර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

9. තෝරා ගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකි තාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසරදී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළා සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වෙයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන පෙදෙසේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඊ. නාගොඩවිතාන,
සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ,
කොළඹ උතුර.

1964 ජනවාරි මස 25 වැනි දින,
කුමාරන් රත්නම් පාර, කොළඹ 2,
කොළඹ උතුර අධ්‍යාපන කාර්යාලයේදීය.

2–29—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා පූර්ව භාග 10.30 වන තෙක් කොළඹ 3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, සිරිමතිපාය, නො. 58, අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

| පාසලේ නම | කළයුතු වැඩය |
| --- | --- |
| හ/තංගල්ල මහා විද්‍යාලය ය | දෙමහල් පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |

**සංලක්ෂ්‍යය.**—හ = හම්බන්තොට දිස්ත්‍රික්කය.

2. ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කොන්ත්‍රාත් කරුවන් රුපියල් 90,000.00 ට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ද රුපියල් 1,20,000 ට නොඅඩු ගණනකට රජයේ වැඩ දෙපාර්තමේන්තුවේද ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි විය යුතුයි.

3. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති ගොඩනැගිලි වැඩ සඳහා දෙවැනි ඡේදයේ සඳහන් ගණන් වලට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචිවී ඇත්නම් ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

4. වර්ෂ 1964 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා දාවල් 12 තෙක් ටෙන්ඩර් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ.සී. ශාඛාව), මැලේ වීදිය, කොළඹ 2, හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක මෙම වැඩය වෙනුවෙන් රුපියල් 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය තංගල්ලේ අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කළ යුතුය. චෙක් පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය බාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් (එස්.ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ තංගල්ලේ අධ්‍යාපන නිළධාරි තැනගෙන් ලබා ගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ට හා සමිති වලට පමණකි.

6. ඉහත සඳහන් දෙවැනි සහ තුන්වැනි ඡේදයන්හි දැක්වෙන පරිදි තංගල්ලේ අධ්‍යාපන නිළධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර පත්‍ර එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමඟය. සියළුම විස්තර සහ තොරතුරු තංගල්ලේ අධ්‍යාපන නිළධාරි තැනගෙන් දැන ගත හැකිය. සැලැස්මවල්ද එහිදී ලබාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන්

නොඑවන්නේ නම් ඔහු හෝ ඔහුගේ නියෝජිතයෙක් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර නිලධාරි තැනට බාරදී එසේ බාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ බාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුයි.

7. වර්ෂ 1964 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට කොළඹ 3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද ටෙන්ඩර් විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද, ටෙන්ඩර්කරුගේ නමද, පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබූ අවසාන දින සිට සති හයකට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර තංගල්ලේ අධ්‍යාපන නිලධාරි තැන ගෙන් දැන ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැකිය.

10. වැඩය බාරගන්නා කොන්ත්‍රාත් කරුවන් විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කරන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුයි. ලාංකික වූ හා වැඩය කරන ප්‍රදේශයෙහි වූ සේවකයන් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂක වරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අනිත් සෑම විටම ඉහතකී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළා සේ සලකනු ලැබීමට කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමැතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කරන ප්‍රදේශයෙහි නොවූ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

සී. ඒ. ජී. ප්‍රනාන්දු,
අධ්‍යාපන නිලධාරි තැන.

1964.1.29 වැනි දින,
තංගල්ලේ,
අධ්‍යාපන කාර්යාලයේදීය.

2–156—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 පෙබරවාරි මස 28 වෙනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| (1) ක/පැලැන්ද මුස්ලිම් පාසැල | පාසැල් ගොඩනැගිල්ල, ළිඳ සහ වැසිකිලි. |
| (2) ක/දොඹගොඩ මහා විද්‍යාලය | විද්‍යාගාරය. |
| (3) ක/පන්නිල සි. මි. පාසැල ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (4) ක/හෙවෙස්ස සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිලි. |

සංලක්ෂ්‍යය.—ක=කළුතර දිස්ත්‍රික්කය.

2. ගොඩනැගිලි තැනීමේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් පහත දක්වන අයුරු ලියා පදිංචි වී ඇති අයවළුන්ට වර්ෂ 1964 පෙබරවාරි මස 27 වෙනි බ්‍රහස්පතින්දා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. එනම් :—

අංක (1) යන වැඩට රු. 23,000 හෝ ඊට වැඩි ගණනකට ද,

අංක (2) සහ (3) යන වැඩවලට රු. 20,000 හෝ ඊට වැඩි ගණනකට ද,

අංක (4) යන වැඩට රු. 16,000 හෝ ඊට වැඩි ගණනකට ද,

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී සිටිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින්, කොළඹ 2, මලයි වීදියේ පිහිටි අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කළුතර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ, එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 බැගින් මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සි කළුතර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. චෙක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාර ගනු නො ලැබේ. අනුමත සමිති ටෙන්ඩර් මුදලෙන් නිදහස් කර ඇත.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ චවුචර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ පාසැල් ගොඩනැගිලි පිළිබඳ ශාඛාවෙන් හෝ කළුතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් ද ලබා ගත හැකිය. මුදල් තැන්පත් කිරීමේ චවුචර නිකුත් කරනු ලබන්නේ ඉහත පෙනෙන 2 වන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයන් අනුව ලියා පදිංචි වී ඇති බව ඔප්පු කරන කොන්ත්‍රාත් කරුවන්ට හෝ සමිතිවලට පමණි.

5. ඉහත සඳහන් 2 වන ඡේදයේ දක්වන පරිදි කළුතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තැන ගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සැලැස්මවල් සහ සියළුම විස්තර හා තොරතුරු එම කාර්යාලයේ දී දැන ගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර, කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් නො එවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අධ්‍යාපන අමාත්‍යාංශයේ/අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ/ කළුතර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහායක තැනට භාර දී එසේ භාර ගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද වැඩයේ නමද සඳහන් කර තිබිය යුතුය.

6. වර්ෂ 1964 පෙබරවාරි මස 28 වෙනි සිකුරාදා පස්වරු 2.30 ට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපනාධ්‍යක්ෂ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

7. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබූ අවසාන දින සිට සති හයකට නො අඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

8. වෙනත් අවශ්‍ය විස්තර කාර්යාලීය වේලාවලදී කළුතර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකිවන අතර ටෙන්ඩර් සම්බන්ධ ලියවිලි එහිදී පරීක්ෂා කර බැලිය හැකිය.

9. වැඩය භාර ගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම පුහුණු හා නුපුහුණු සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කරන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කරන ප්‍රදේශයෙහි වූ සේවකයන් පමණක් වැඩයෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්වරයා ගෙන් සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසර දෙනු ලබන විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකලාසේ සැලකනු ලැබීමට ද කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද සුමත් වේ. එවැනි අනුමැතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කරන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩයෙහි යෙදවීම තහනම් ය.

එච්. ඒ. වී. සොයිසා,
කළුතර සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

1964 ජනවාරි මස 30 දින,
කළුතර, අධ්‍යාපන කාර්යාලයේදී ය.

2–178/1—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

එවිය යුතුය. ප්‍රාදේශිය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන් නො එවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද, වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

6. වර්ෂ 1964 පෙබරවාරි 28 වෙනි සිකුරාදා පෙරවරු 10.30 ට කෑගල්ල අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරණ ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද ටෙන්ඩර් විවෘත කරණ නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද, ටෙන්ඩර් කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබූ අවසාන දින සිට සති හයකට නො අඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

8. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම පුහුණු හා නුපුහුණු සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කරවන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකික වූ හා වැඩය කරන ප්‍රදේශයෙහි වූ සේවකයන් පමණක් වැඩයෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්වරයා ගෙන් සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් අවසර දෙනු ලබන විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකලාසේ සලකනු ලැබීමට ද කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමටද යටත් වේ. එවැනි අනුමැතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කරන ප්‍රදේශයෙහි නො වූ හෝ ලාංකික සේවකයින් වැඩයෙහි යෙදවීම තහනම් ය.

කේ. අසෝකා ධර්මකීර්ති,
කෑගල්ලේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ.

1964 ජනවාරි 25 වැනි දින,
කෑගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දී ය.

2–22—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

1964 මාර්තු සිට 1964 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා නාරාහේන්පිට ලුණු ගබඩාවට (ඉරු දෙකේ) පොල් අතු 50,000 ක් පමණ සැපයීම සහ ගෙනත් භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤවීදියේ අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතෙහි ලුණු කොමසාරිස් තැන විසින් 1964 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා පස්වරු 3 වන තුරු බාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ, අනුපිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගන්නා ආකෘති පත්‍ර වලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25 ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් කායඝාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ලුණු කොමසාරිස් කාර්යාලයේ මුදල් තැන්පත් කරන්නේ නම් චැක්පත් වලින් සැපයිය යුතුයි.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
වැඩ බලන ලුණු කොමසාරිස්.

1964 පෙබරවාරි 7 වැනි දින,
කොළඹ 2.

2–85—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට පලල් මාගී, තද ලී සිල්පර කොට සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් (ලිපිනය: 120 කාමරය, 1 වැනි තට්ටුව, මහා ලේකම් කායඝාලය, කොළඹ 1) 1964 මාර්තු මස 18 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ හරියාකාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධ ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරිතැනගේ කායඝාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීතැනගේ කායඝාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1964 මාර්තු මස 17 වැනි අඟහරුවාද පස්වරු 3.30 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1964 මාර්තු 18 වැනි බදාදා පෙරවරු 11.05 ට අමාත්‍යාංශ කායඝාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරිතැනගේ කායඝාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1964 ජනවාරි මස 25 වැනි දින,
කොළඹදීය.

2–64—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

### උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කන්තලේ උක් වගාවට පහත සඳහන් උපකරණ සැපයීම සඳහා කොළඹ 2 නම්වර 48 ශ්‍රී ජිනරතන පාරෙහි, පිහිටි ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයෙහි සභාපති තැන විසින් 1964 පෙබරවාරි මස 25 වෙනි දින පස්වරු 3.00 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

1. සාමාන්‍ය වර්ගයේ උක් ගෙනයාමේ යන්ත්‍ර ... 60
2. යන්ත්‍රවලින් කපන ලද උක් ගෙන යාම සඳහා බෝඩිය සහිත ටොන් 5 පිපිං ට්‍රේලර් ... 40
3. බෝසර් සවි කරන ලද අශ්වබල 70 (4 wheel drive) රෝද ට්‍රැක්ටර් ... 4
4. අශ්වබල 35 රෝද ට්‍රැක්ටර් සමග යෙදිය හැකි ත්‍රිපොයින්ට් ලින්කේජ් ඔප් බාරින් උපකරණ කට්ටල ... 6
5. අශ්වබල 65 දම්වැල් යොදන ලද ට්‍රැක්ටර් යන්ත්‍රවල යෙදිය හැකි උසස් ඉවත් කිරීමේ ක්‍රියාකාරිත්වයකින් යුත් යන්ත්‍රානුසාරයෙන් උස් කරන ලද ඇති නගුල් ... 2
6. රෝද හතරේ ක්‍රියාකාරිත්වයෙන් යුත් වාහන ... 3
7. ජංගම වායු සම්පීඩකයන් ... 3
8. ජංගම ගිනියම් කර පැස්සීමේ යන්ත්‍ර ... 1

ආපසු ලබා ගත හැකි රුපියල් 500 ක මුදලක් තැන්පත් කිරීමෙන් කොළඹ 2 නම්වර 48 ශ්‍රී ජිනරතන පාරෙහි පිහිටි ශ්‍රී ලංකා සීනි සංයුක්ත මංඩලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පත් පිටපත් 2 කින් ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය වෙනත් විස්තර ලේකම් තැනගෙන් දැනගත හැකිය.

1964 පෙබරවාරි මස 24 වෙනි දින පස්වරු 4.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

සභාපති.

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මංඩලය,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2.

2–164—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

## කිරි මණ්ඩලය

### බටර් ඔතන කඩදාසි සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම

අඟල් 8 1/2 ක් දිග අඟල් 6 1/2 ක් පළල අපේ සැලැස්ම අනුව අච්චු ගැසූ බටර් ඔතන තෙල් කඩදාසි කෑලි 250,000 ක් සැපයීම සඳහා මිළ ගණන් මව්සින් බාරගනු ලැබේ. මිළ ගණන් සමග එකී ප්‍රමාණයේ කඩදාසි කෑලි අඩු වශයෙන් 5 ක් වත් කැපීමට හැකිවන තරමේ සාම්පල් කඩදාසි කැල්ලක් ද එවිය යුතුය.

මිළ ගණන් කවරවල බහා පිට පැත්තේ වම් කෙළවරේ " බටර් ඔතන කඩදාසිවලට මිළ ගණන් " යි ලියා කොළඹ 5, නාරාහේන්පිට, කිරි මණ්ඩලයේ සභාපතිට 1964 මාර්තු මස 11 වැනි බදාදා පස්වරු 2 ට පෙර ලැබෙනසේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

වැඩි විස්තර මේ කායයාලයේ මාණ්ඩලික සහකාරගෙන් ලබාගත හැක.

ඇම්. බී. සල්මන්,
සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය ප්‍රධාන කායයාලය,
කොළඹ 5,
1964.1.25.

2-13—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්තශාලා සංයුක්ත මණ්ඩලය

වාලච්චේනෙහි නැගෙනහිර කඩදාසි කම්හලට, පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටැන්ඩර් පත් කැඳවනු ලැබේ :—

පිඟන් මැටි දිග් ටොන් 450.
1964 මාර්තු 17 වැනි දින අ. භා. 2 ට ටෙන්ඩර් වසනු ලැබේ.
ටැන්ඩර් පත් සහ වෙනත් විශේෂ විස්තර ඉල්ලුම් කළ විට ලබා ගත හැක.

සභාපති,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලා සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
අංක 70, යෝක් වීදිය,
කොළඹ 1.
1964 ජනවාරි මස 29 දින.

2-197—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පදියතලාවේ ගැමි රෝහල තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වර්ෂ 1964 මාර්තු මස 11 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මඩකලපුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 පෙබරවාරි මස 21 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,00,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 1964.2.1.

2-200/1—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

මුලතිව් රෝහලේ මුලුතැන්ගෙයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 මාර්තු මස 11 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මුලතිව්හි ර. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 පෙබරවාරි මස 21 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,50,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 1964 පෙබරවාරි 1.

2-200/2—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ තුරඟ තරඟ පිට්යේ කර්මාන්ත ප්‍රදර්ශන භූමියේ වැසිකිළි පන්ති 12ක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වර්ෂ 1964 පෙබරවාරි මස 26 වැනි බදාදා පෙ. ව. 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7, ටොරිංටන් පෙදෙසෙහි කර්මාන්ත ප්‍රදර්ශනය භාර ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,50,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250 තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් කළ හැක.

4. ටෙන්ඩර් තැන්පත් කුවිතාන්සිය නියමිත දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට නොහැකි වූ ඉල්ලුම්කරුවන්ගෙන් ප්‍රමාද වූ සෑම දිනකට හෝ දින කොටසක් වෙනුවෙන් රු. 25ක ගාස්තුවක් ටෙන්ඩර්පත් නිකුත් කරන නිලධාරිතැන විසින් අයකරගනු ලැබේ. මේ මුදල ආපසු ගෙවනු නොලැබේ. මේ අනුව ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය දීර්ඝ නොකරනු ඇත.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂක වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1. 1964.2.1.

2 200/3—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1964 වර්ෂය තුල කොළඹ බටහිර කොටසේ අංක 1 ඒ දරණ කොටුවේ ආණ්ඩුවේ ගොඩනැගිලිවලට සුළු අළුත් වැඩියාකිරීම් නඩත්තුව හා ආණ්ඩුවේ ගොඩනැගිලිවලට ජල පවහනය හා ජල සේවය නඩත්තු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 7 ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. අධි. ඉං. ගොඩනැගිලි තැනගේ කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 පෙබරවාරි මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වනතෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. බටහිර කොළඹ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 40,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

එස්. සෙල්වදුරෙයි,
ගොඩනැගිලි පිළිබඳ අධිකාරී ඉංජිනේරු.

කොළඹ 7, ගො. පිළිබඳ අධි. ඉං. කාර්යාලය,
1964.1.27.

2–27/1—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1964 වර්ෂය තුල කොළඹ බටහිර කොටසේ අංක 1 බී දරණ කොටුවේ ආණ්ඩුවේ ගොඩනැගිලිවලට සුළු අළුත් වැඩියාකිරීම් නඩත්තුව හා ආණ්ඩුවේ ගොඩනැගිලිවලට ජල පවහනය හා ජල සේවය නඩත්තු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කොළඹ 7 ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. අධි. ඉං. ගොඩනැගිලිතැනගේ කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 පෙබරවාරි මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වනතෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. බටහිර කොළඹ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 30,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

එස්. සෙල්වදුරෙයි,
ගොඩනැගිලි පිළිබඳ අධිකාරී ඉංජිනේරු.

කොළඹ 7, ර. වැ. දෙ. පිළිබඳ අධි. ඉං. කාර්යාලයේදීය,
1964.1.27.

2–27/2—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1964 වර්ෂය තුල කොළඹ බටහිර කොටසේ අංක 1 සී දරණ කොටුවේ ආණ්ඩුවේ ගොඩනැගිලිවලට සුළු අළුත් වැඩියාකිරීම් නඩත්තුව හා ආණ්ඩුවේ ගොඩනැගිලිවලට ජල පවහන හා ජල සේවය නඩත්තු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 7 ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. අධි. ඉං. ගොඩනැගිලි තැනගේ කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 පෙබරවාරි මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වනතෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. බටහිර කොළඹ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 30,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

එස්. සෙල්වදුරෙයි,
ගොඩනැගිලි පිළිබඳ අධිකාරී ඉංජිනේරු.

කොළඹ 7, ගො. පිළිබඳ අධි. ඉං. කාර්යාලය,
1964.1.27.

2–27/3—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1964 වර්ෂය තුල කොළඹ බටහිර කොටසේ අංක 1 ඩී දරණ කොටුවේ ආණ්ඩුවේ ගොඩනැගිලිවලට සුළු අළුත් වැඩියාකිරීම් නඩත්තුව හා ආණ්ඩුවේ ගොඩනැගිලිවලට ජල පවහනය හා ජල සේවය නඩත්තු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ, 7 ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. අධි. ඉං. ගොඩනැගිලි තැනගේ කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1964 පෙබරවාරි මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වනතෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. බටහිර කොළඹ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 49,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

එස්. සෙල්වදුරෙයි,
ගොඩනැගිලි පිළිබඳ අධිකාරී ඉංජිනේරු.

කොළඹ 7, ගො. පිළිබඳ අධි. ඉං. කාර්යාලය,
1964.1.27.

2–27/4—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියයි

කෙලික්ස් වර්ගයේ ගල් විදින යන්ත්‍ර සඳහා අමතර කොටස් තොගයක් 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා පෙරවරු 10.00 ට රත්මලානේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයෙහිදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ විෂයයන් වෙන්දේසිය පවත්වනු දිනයට පෙර දින පෙරවරු 9.00යේ සිට පස්වරු 3.00 දක්වා ඉහත සඳහන් ස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැක.

වෙන්දේසිය නිම්වූ වූ වහාම සම්පූර්ණ මුදල ගෙවා ද්‍රව්‍ය වහාම ඉවත් කර ගත යුතුය.

බා. සෙල්ලහේවා,
සාමාන්‍යාධිකාරී.

යාන්ත්‍රික අංශය,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
රත්මලාන, 64.1.27.

2–144—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දව විකිණීමේ දන්වීමයි

හල්මිල්ල ඇතුළු පළමුවැනි, දෙවැනි හා තුන්වැනි පංතිවලට අයත් ජනප්‍රිය ප්‍රමාණයන්ගෙන් යුත්, වැඩිමනත් ඉරූ දව 64.2.29 වෙනි දින දක්වා කැලෑ දෙපාර්තමේන්තුවට අයත්, තිඹොල්කැටියේ දව ගබඩාවෙන් මිලදී ලබා ගත හැක.

වැඩි විස්තර තිඹොල්කැටියේ, අතිරේක දිසා වන නිලධාරීගෙන් බලාගත හැක.

ම. නමසිවායම්,
වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කාර්යාලය,
තැ. පෙ. 509,
කොළඹ 2, 29.1.64.

1–184—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

කුරුණෑගල ගබඩාවේ ඇති බුරුත, පලු හා මිල්ල කඳන් 77කින් හා ඝණ අඩි 381.3කින් යුත් දැව තොග 3ක් 1964 පෙබරවාරි 14 වන දින උදය 10ට ඉහතකී ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙන්දේසියට පෙර ඉල්ලුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැක. අදාල වැඩි විස්තර කුරුණෑගල උප ගබඩා පාලකගෙන් හෝ වයඹ දිසා කැලෑ කාර්යාලයෙන් පැමිණ ලබා ගත හැක.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරී.

තැ. පෙ. අංක 10,
කුරුණෑගල,
64.1.27.

2–172—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය

අලුත් කපන ලද ඝන අඩි 137.4කින් යුත්, මැහොගනි, හල්මිල්ල හා බටදොඹ තොග තුනක් 1964 පෙබරවාරි මස 17 වන දින උදය 10ට මීරිගම අඩවියේ වල්බෝතලේ දැව ගබඩාවේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙන්දේසියට පෙර ඉල්ලුම්කරුවන්ට පරීක්ෂාකර බැලිය හැක. මෙයට අදාල වැඩි විස්තර වල්බෝතලේ ගබඩා පාලකගෙන් හෝ වයඹ දිසා කැලෑ කාර්යාලයෙන් පැමිණ ලබාගත හැක.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරී.

තැ. පෙ. අංක 10,
කුරුණෑගල,
64.1.22.

2–173—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසිය

1964 ජනවාරි 31 වෙනි දින අංක 13,937 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි මෙම ප්‍රසිද්ධ වෙන්දේසිය පිළිබඳව පලකරණ ලද 1964 ජනවාරි මස 27 වෙනි දින දරණ නිවේදනයේ දෙවෙනි ඡේදයේ දැක්වූ පරිදි මෙම ප්‍රසිද්ධ වෙන්දේසිය පවත්වනු ලබන්නේ 1964 පෙබරවාරි මස 15 වෙනි දින නොව 1964 පෙබරවාරි මස 17 වෙනි සඳු දින නාරාහේන්පිට පොලිස් මධ්‍යම ගරාජයේදී බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ඇස්. ඇස්. ජයතිලක,
සහකාර පොලිස් අධිකාරී, ප්‍රවාහණ අංශය.

1964 පෙබරවාරි මස 5 වෙනි දින,
කොළඹ-නාරාහේන්පිට, පොලිස් ප්‍රවාහණ
කාර්යාලයේ දීය.

2–280—64.2.7 දින අංක 13,944 දරන ගැසට් පත්‍රය

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එව්ය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයකමුදල් භාරගනු නොලැබේ.**

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඞ කරන්නාගේ වගකීම පිට**ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය-යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ **පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.**

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඞ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

13. 63. 8. 1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 17 50 | ... | 23 00 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 25 00 | ... | 33 00 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... ... ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 60 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 15 | ... | 0 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි